මගේ අංකය )
ඔබේ අංකය ) TA/06/01/2014

පොදු චක්‍රලේඛ ලිපි අංක:- 02 - 74/2012 .

මගේ අංකය:- ටීඒ/එස්ඒ/07/2003.
සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.
2012.06.25

විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානීන්,
ආයතන ප්‍රධානීන් වෙත,

**<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තිය සේවාවන් සහ</u>**
**<u>අතුරු වෛද්‍ය සේවා පුහුණු පාසල් විදුහල්පති, / ආචාර්ය තනතුරු සඳහා</u>**
**<u>ඉගැන්වීමේ දීමනා ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධ මගේ සමාංක හා 2011.12.14 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02 - 185/2011 දරණ චක්‍රලේඛය මින් අවලංගු කරමි.

02. ඉහත සඳහන් සෞඛ්‍ය ආචාර්යවරුන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන ඉගැන්වීමේ දීමනාව රුපියල් 10000/= දක්වා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ " සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආචාර්යවරුන් සඳහා ඉගැන්වීමේ දීමනාව වැඩි කිරීම " මැයෙන් වූ අමප/12/0357/509/007 - I හා 2012.03.29 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව පූර්ණකාලීනව සේවයේ යෙදෙන, මේ වනවිට ආචාර්ය දීමනාව හිමි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තිය සේවාවේ විදුහල්පතිවරුන්ට සහ ආචාර්යවරුන්ට, අතුරු වෛද්‍ය සේවාවේ විදුහල්පතිවරුන්ට සහ ආචාර්යවරුන්ට අදාල දීමනාව 2012.03.01 දින සිට ගෙවීම් කල යුතුවේ.

04. මෙම දීමනාව විශ්‍රාම වැටුප් රහිත දීමනාවකි.

05. තවද, අදාල විදුහල්පතිවරුන් හා ආචාර්යවරුන් විසින් සාමාන්‍ය රාජකාරි කාලය ඉක්මවා ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් පෙර පරිදිම නොකඩවා ලබාගත හැකි බවද දන්වා සිටිමි.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

) 2698475
...பசி ) 2698490
...one ) 2698507

...ක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

මගේ අංකය )
எனது இல ) TA/06/01/2014
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2014.01. 29
Date )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA
සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

ආණ්ඩුකාර ලේකම්වරුන්,

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

<u>අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විදුහල්පති හා ආචාර්යවරුන් සඳහා ඉගැන්වීම් දීමනා ගෙවීම.</u>

ඉහත කාරුණට අදාලව අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ආචාර්යවරුන්ට වැටුපට අමතරව ගෙවනු ලබන ඉගැන්වීම් දීමනාව පොදු චක්‍රලේඛ ලිපි අංක 02-74/2012 හා 2012.06.25 දිනැති චක්‍රලේඛය මගින් 2012.03.01 දින සිට රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි ගෙවීම් කරනු ලැබේ. (අදාල චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02. ඒ අනුව ඔබ පළාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විදුහල්පති හා ආචාර්යවරුන් සඳහා එම දීමනාව ගෙවීමට අවශ්‍ය කටයුතු නොපමාව සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.